# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2352/03 - 2023 ඔක්තෝබර් මස 02 වැනි සඳුදා - 2023.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය**

මෙම QR කේතය Scan කර ලියාපදිංචි තොරතුරු බලාගත හැක. නැතිනම් ec.lk/vrd අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න•

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව 2023(3) පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය, හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය

*<u>අර්ථ දැක්වීම.</u>*

01. "ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත" - 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත.

02. "2023(3) පරිපූරක ලැයිස්තු" - 2023 ඔක්තෝබර් මස 01 සිට 2024 ජනවාරි මස 31 දින දක්වා කාලසීමාව ඇතුළත යම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන හා 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා නිර්දේශිත තැනැත්තන්ගේ නම් සඳහන් වන ලැයිස්තුව.

*<u>පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන</u>*

| ප්‍රදර්ශනය පිණිස තබනු ලබන ස්ථානය | ප්‍රදර්ශනය පිණිස තබා ඇති ලැයිස්තු හෝ ඒවායේ කොටස් |
|---|---|
| 01. එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අදාළ මැතිවරණ කොට්ඨාසයෙහි පරිපූරක ලැයිස්තු සම්පූර්ණ පිටපත. |
| 02. එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන පරිපූරක ලැයිස්තු කොටසෙහි පිටපතක්. |
| 03. එක් එක් පළාත් පාලන ආයතනය | අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන පරිපූරක ලැයිස්තු කොටසෙහි පිටපතක්. |
| 04. එක් එක් ග්‍රාම නිලධාරි කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන පරිපූරක ලැයිස්තු කොටසෙහි පිටපතක්. |


1A - G 40423 — 21 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපදෙස්*

01. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව 2023(3) පරිපූරක ලැයිස්තු පිළියෙල කර අවසන් බව හා එම ලැයිස්තු හෝ ඒවායේ කොටස් කාර්යාල වේලාවන් හි දී ඉහත සඳහන් ප්‍රදර්ශන ස්ථානයන්හි දී මහජනයාට පරීක්‍ෂා කිරීම පිණිස තබා ඇති බවත්; මෙහි පහත උපලේඛනයෙහි i වන තීරයෙහි සඳහන් මැතිවරණ කොට්ඨාස සඳහා එහි II වන අනුරූප සටහනේ සඳහන් සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් 2023.10.02 දින පරිපූරක ලැයිස්තු සම්පූර්ණ කර ඇති බවත්; ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 20 අ (5) උප වගන්තිය යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි වෙනුවෙන් දැනුම් දෙනු ලැබේ.

02. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අනුකූලව 2024.01.31 දිනට අටලොස් විය සම්පූර්ණ වන එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තාවූ එහෙත් පරිපූරක ලැයිස්තුවට ඇතුළත් කර නොමැති යම්කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උපලේඛනයේ නියම කර ඇති ''අ'' සහ ''ආ'' ආකෘතියට සාරානුකූලව හෝ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා හඳුන්වා දී ඇති YC ආකෘතියක් මගින් හෝ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමග 2023 ඔක්තෝබර් මස 02 දින සිට දින 10 ක් ඇතුළත එනම් 2023 ඔක්තෝබර් 11 දින හෝ ඊට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරි (දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය) වෙත ලැබිය යුතුය.

03. මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තාවූ යම් කෙනෙකුට; තමාගේ නම හෝ එකී ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තාවූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි ''ඇ'' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පරිපූරක නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට එනම් 2023 ඔක්තෝබර් මස 02 දින සිට දින දහයක් ඇතුළත එනම්; 2023 ඔක්තෝබර් මස 11 දින හෝ ඊට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

04. හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවයක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 7 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කිරීමේ නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2023 ඔක්තෝබර් මස 16 වැනි දින ප්‍රසිද්ධ කරනු ඇත.

05. හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ''අ'' ''ආ'' YC ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ''ඇ'' ''ඈ'' ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ පළාත් පාලන ආයතන කාර්යාල හෝ ග්‍රාම නිලධාරි කාර්යාලවලින් ලබා ගත හැකිය.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්,
මැතිවරණ කොමිෂන් සභාව.

2023 ඔක්තෝබර් මස 02 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *I වැනි තීරය*<br>*මැතිවරණ කොට්ඨාසය* | *II වැනි තීරය*<br>*2023(2) පරිපූරක ලැයිස්තු සකස් කළ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි* |
|---|---|
| 01. කොළඹ | පී. ඒ. එස්. සේනාරත්න |
| 02. ගම්පහ | කේ. ජේ. එස්. මාධව |
| 03. කළුතර | කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු |
| 04. මහනුවර | එච්. ඩී. එන්. සම්පත් ප්‍රනාන්දු |
| 05. මාතලේ | එච්. ඒ. ඊ. පුෂ්පකුමාර |
| 06. නුවරඑළිය | කේ. ඒ. එල්. එස්. කලුගම්පිටිය |
| 07. ගාල්ල | ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර |
| 08. මාතර | ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදි |
| 09. හම්බන්තොට | රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ |
| 10. යාපනය | ආර්. සී. අමල්රාජ් |
| 11. වන්නි | ජේ. ජෙනිටන් |
| 12. මඩකලපුව | එම්. බී. එම්. සුෆියාන් |
| 13. දිගාමඩුල්ල | කසුන් ශ්‍රීනාත් අත්තනායක |
| 14. ත්‍රිකුණාමලය | පියුමි ආටිගල |
| 15. කුරුණෑගල | ආර්. එම්. එච්. බී. රත්නායක |
| 16. පුත්තලම | එස්. එල්. ආර්. ජයනායක |
| 17. අනුරාධපුරය | කේ. මුහුන්දන් |
| 18. පොළොන්නරුව | පියුමි ආටිගල |
| 19. බදුල්ල | කේ. කාන්දීපන් |
| 20. මොණරාගල | එන්. රේගන් |
| 21. රත්නපුර | සුරංග අඹගහතැන්න |
| 22. කෑගල්ල | සජිත් පී. කස්තුරිසිංහ |

EOG 10 - 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.